AL/2020/47-S-I(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය / புதிய பாடத்திட்டம் / New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

| | | |
|---|---|---|
| ඉස්ලාම් ශිෂ්ටාචාරය I<br>இஸ்லாமிய நாகரிகம் I<br>Islamic Civilization I | 47 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>*Two hours* |

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පසුපිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** ජාහිලියියා සමයේ කඃබාවෙහි පරිපාලනය හැඳින්වූ නම කුමක් ද?
(1) සිකායා (2) ලිවා (3) හිජාබා (4) රිබාදා (5) නද්වා

**2.** අබූ උස්මාන්ගේ නායකත්වයෙන් යුත් වෙළෙඳ දූත කණ්ඩායම ඊජිප්තුවට පිටත්කරන ලද්දේ ශ්‍රී ලංකාවේ කුමන රාජ්‍ය සමයේ දී ද?
(1) ගම්පොළ (2) යාපහුව (3) අනුරාධපුර
(4) පොලොන්නරුව (5) මහනුවර

**3.** ඉස්ලාම්, මිනිසා මත පටවා ඇති වගකීම් පෙන්වන කාණ්ඩය කුමක් ද?,
(1) ඉබාදත්, හික්මත්, නුස්රත් වේ. (2) ඉබාදත්, ඉමාරත්, කිලාෆත් වේ.
(3) රිසාලත්, ඉස්මත්, වකාලත් වේ. (4) තෞහීද්, රිසාලත්, මආද් වේ.
(5) ඉමාරත්, ඉජාරත්, සිකායත් වේ.

**4.** ඉමාම් අහ්මද් ඉබ්නු හම්බල් (රහ්) තුමාගේ ජනප්‍රිය වූ ෆික්හු ග්‍රන්ථය කුමක් ද?
(1) මසාඉල් සාලිහ් (2) කිතාබුර් රිසාලා (3) මුකද්දිමා
(4) පුතුහුල් කෛබ් (5) ෆික්හුල් කබීර්

**5.** ශ්‍රී ලංකාවේ වැලිගම පිහිටි 'මද්රසතුල් බාරි' හි නිර්මාතෘ කවුද?
(1) මුබාරක් මව්ලානා වේ. (2) ෂෙයිහ් මුස්තෆා වලියුල්ලා වේ.
(3) මාප්පිලෙයි ලෙබ්බේ ආලිම් වේ. (4) අල්-බාදිබ් අල්-යමානි වේ.
(5) කසාවත්තේ ආලිම් සාහිබ් වේ.

**6.** හුදෛබියා සම්මුතියේ සටහන් වූ අවස්ථාවේ මක්කා සිට මදීනාවට පැමිණි සහාබිවරයෙක් කුරෛෂ්වරුන් විසින් නැවතත් මක්කාවට කැටුව ගියේ ය. එම සහාබිවරයා වන්නේ,
(1) අබූ ජන්දල් (රලි) වේ. (2) අබූ සඊද් අල් කුද්රි (රලි) වේ.
(3) අබ්දුර් රහ්මාන් බින් අව්ෆ් (රලි) වේ. (4) සඃද් බින් අබී වක්කාස් (රලි) වේ.
(5) මආද් බින් ජබල් (රලි) වේ.

**7.** පහත ප්‍රකාශවලින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ඉමාම් මාලික් (රහ්) තුමා තෆ්සීර් දේශකයන් අතුරෙන් කෙනෙකි.
(2) දීනේ ඉලාහි යන චින්තනය මෝගල් රජු බාබර් ඉදිරිපත් කර ඇත.
(3) වෛද්‍ය විද්‍යාඥ ඉබ්නු නෆීස් රුධිර සංසරණය පිළිබඳ අදහස් ප්‍රකාශ කර ඇත.
(4) අකබා සම්මුතිය නබිතුමා සහ මක්කා වැසියන් අතර සිදු වූවකි.
(5) ඉස්ලාම් ශිෂ්ටාචාරය අරාබි සංස්කෘතිය පදනම් වූවකි.

[දෙවැනි පිටුව බලන්න.

**8.** පහත දැක්වෙන හදීස් අතුරෙන් ප්‍රබලව පවතින හදීස් වන්නේ,
(1) හදීස් මෂ්හූර් ය. (2) හදීස් මුතවාතිර් ය. (3) හදීස් මර්ෆූඋ ය.
(4) හදීස් සහීහ් ය. (5) හදීස් මුර්සල් ය.

**9.** මුස්තෆා කමාල් විසින් පාලනයෙන් නෙරපා හරින ලද අවසාන උස්මානීය සුල්තාන් වන්නේ,
(1) සුල්තාන් මුරාද් වේ. (2) සුල්තාන් සලාහුදීන් වේ.
(3) සුල්තාන් සලීම් වේ. (4) සුල්තාන් අබ්දුල් හමීද් වේ.
(5) සුල්තාන් මුහම්මදු අල්-ෆාතිහ් වේ.

**10.** සාහිබුස්සිර් යනුවෙන් හැඳින් වූ නබිතුමාගේ මිතුරා කවුද?
(1) අලි (රළි) (2) හුදෛබතුල් යමානි (රළි) (3) මුආවියා (රළි)
(4) හසන් (රළි) (5) අබූ මුසා අල්-අෂ්අරි (රළි)

**11.** පහත සඳහන් අය අතුරෙන් අල්-කුර්ආනයට අර්ථ දැක්වීම් රචනා කළ දෙදෙනෙකු දැක්වෙන වරණය තෝරන්න.
(1) ෆක්රුද්දීන් අර්රාසි (රහ්) - ෆුලෛල් බින් ඉයාල් (රහ්)
(2) ඉමාම් ෂාහ් වලියුල්ලාහ් (රහ්) - ඉමාම් අබ්දුල් වහාබ් (රහ්)
(3) මව්ලානා ඉල්යාස් (රහ්) - මව්ලානා මව්දූදි (රහ්)
(4) ඉමාම් ඉබ්නු තයිමියා (රහ්) - ඉමාම් බුහාරි (රහ්)
(5) ඉමාම් ඉබ්නු කසීර් (රහ්) - සහීද් සෙයියද් කුතුබ් (රහ්)

**12.** ශ්‍රී ලංකාවේ වෙරළාසන්නයේ මුලින්ම පිහිට වූ මුස්ලිම් ජනාවාස නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.
(1) ත්‍රිකුණාමලය, හම්බන්තොට, පුත්තලම, මන්නාරම වේ.
(2) කොළඹ, බේරුවල, හම්බන්තොට, පොතුවිල් වේ.
(3) යාපනය, ත්‍රිකුණාමලය, මඩකලපුව, කල්පිටිය වේ.
(4) මන්නාරම, බේරුවල, කොළඹ, පුත්තලම වේ.
(5) බේරුවල, මඩකලපුව, කල්පිටිය, පොතුවිල් වේ.

**13.** ඉමාම්වරුන් වන මුස්ලිම් (රහ්), අබූ දාවූද් (රහ්) යන අයගේ උපන් ස්ථාන අනුපිළිවෙළින් පෙන්වන වරණය තෝරන්න.
(1) බුහාරා - සමර්කන්ඩ්
(2) නෛසාබූර් - සිජිස්ථාන්
(3) නෛසාබූර් - බුහාරා
(4) කස්වින් - සමර්කන්ද්
(5) කුරාසාන් - සිජිස්ථාන්

**14.** මක්කාහි පිළිම වන්දනාව හඳුන්වා දුන් පුද්ගලයාගේ නම කුමක් ද?
(1) අම්ර් බින් හල්රම් (2) උබෛයි බින් සලූල් (3) උමයියා බින් හල්ෆ්
(4) අබූ ජහ්ල් (5) අම්ර් බින් ලුහෛ

**15.** මදීනා ශාසනයේ කොන්දේසි අතුරෙන් එකක් වනුයේ,
(1) නබිතුමාගේ නායකත්වය සියළු පාර්ශවයන් විසින් පිළිගැනීම ය.
(2) වසර දහයකට යුධ විරාමයක් ගැනීම ය.
(3) මදීනාවෙන් පිටව නොයාම ය.
(4) මහා පාපයන් සිදු නොකර සිටීම ය.
(5) වසර තුනකින් පසුව උම්රාව සඳහා මක්කාවට යෑමට අවසර දීම ය.

**16.** පහත සඳහන් ප්‍රකාශයන් අතුරෙන් ඉස්ලාම් ශිෂ්ටාචාරයේ විශේෂ ලක්ෂණයක් වන ප්‍රකාශය තෝරන්න.
(1) මෙලොව ජයග්‍රහණය ඉලක්ක කොටගෙන තිබීම.
(2) මුස්ලිම්වරු බහුතරය ලෙස ජීවත්වන ස්ථානවලට පමණක් ගැළපෙන පරිදි සැකසී තිබීමයි.
(3) තාර්කික සංකල්පයක් මත රැඳී සිටීමයි.
(4) මෙලොව, පරලොව ජයග්‍රහණය අරමුණ වී තිබීම ය.
(5) නම්‍යශීලී නොවන, දැඩ වූ නීතිවලින් යුක්ත වීම ය.

**17.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් අබූ මූසා අල්-අෂ්අරි (රලි) තුමා පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) දූමතුල් ජන්දල් සාම සාකච්ඡාවල දී අලි (රලි) ගේ නියෝජිතයෙකු ලෙස කටයුතු කළ පුද්ගලයා ය.
(2) හුදෛබියා සම්මුතිය සිදුවන විට නබිතුමාගේ ලේඛකයා ලෙස කටයුතු කළ පුද්ගලයා ය.
(3) අකබා සම්මුතිය සිදුවන විට මදීනා වැසියන්ගේ නායකයා ලෙස සිටි පුද්ගලයා ය.
(4) ඊජිප්තුව ජයග්‍රහණය කොට ඉස්ලාම් අධිරාජ්‍යයට එය ඒකාබද්ධ කළ පුද්ගලයා ය.
(5) කන්දක් යුද්ධයේ දී නබිතුමා සමග විශේෂඥ උපදෙස් හුවමාරු කළ අයයි.

**18.** 'තලඅල් බද්රු අලෛනා' යන ගීතයෙන් නබිතුමාව පිළිගත් අවස්ථාව කුමක් ද?
(1) මක්කා ජයග්‍රහණය (2) මදීනා ප්‍රවේශය (3) හජ්ජතුල් විදා
(4) බද්ර් ජයග්‍රහණය (5) තායිෆ් නගර ප්‍රවේශය

**19.** පහත සඳහන් ප්‍රකාශවලින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
A - තෆ්සීර් යන පදය මෙන්ම තඃවීල් යන පදයත් අල්-කුර්ආන් විවරණය හා සම්බන්ධ වේ.
B - දේශ ගවේෂක කොලම්බස්ට ඉන්දියාවට පැමිණීමට මගපෙන්වන්නා ලෙස සිටියේ ඉබ්නු මාජිද් වේ.
C - නබිතුමාගේ සමයේ තෆ්සීර් කලාව තනි ක්ෂේත්‍රයක් ලෙස බිහි වී තිබුණි.
D - හිජ්රතයෙන් පසු නබිතුමා මුහාජිර්වරු හා අන්සාරිවරු අතර සහෝදරත්ව හැඟීම ඇති කළේ ය.
(1) A B (2) A D (3) B C (4) B D (5) C D

**20.** ක්‍රි.ව. 15 සියවස සිට ක්‍රි.ව. 18 සියවස දක්වා යුරෝපයේ වෛද්‍ය විද්‍යාලවල පෙළපොතක් ලෙස භාවිත කළ මුස්ලිම් විද්වතෙකු විසින් රචිත ග්‍රන්ථය කුමක් ද?
(1) අල්-හාවි (2) කිතාබුත් තෛසීර් (3) අල්-කානූන්
(4) අල්-තෆ්සීර් (5) කිතාබුල් ඉක්තිසාද්

**21.** පහත ප්‍රකාශ සලකන්න.
A - ඉස්ලාම් ඉබාදත්වලට පමණක් සීමාකර තිබීම, ඉස්ලාම් ශිෂ්ටාචාරය වර්ධන නොවී පැවතීමට හේතුවක් ලෙස සැලකිය හැකි ය.
B - දීන් ආරක්ෂා කිරීම, පරම්පරාව රැක ගැනීම, ධනය ආරක්ෂාකර ගැනීම යන්න ද හාජියියාත් යන පදයේ ඇතුළත් වේ.
C - මදීනාවෙහි නබිතුමාගේ සමයේ මුස්ලිම්වරු, යුදෙව්වන් හා මුෂ්රික්වරු එකිනෙකා අතර ගනුදෙනුවල නිරත වූහ.
D - අල් අමීන්, අස්-සාදික් යන අන්වර්ථ නම් නබිතුමාට ලැබුණේ නුබුව්වත් වලින් පසුව ය.
ඉහත ප්‍රකාශවලින් නිවැරදි ප්‍රකාශ ඇතුළත් වරණය තෝරන්න.
(1) A B (2) A C (3) B C (4) B D (5) C D

**22.** පහත දැක්වෙනුයේ අකීදා පදනම්ව සැකසුනු චින්තන කණ්ඩායම්වල අදහස් කීපයකි.
A - මහා පාපයන් කළ අයව අල්ලාහ්ට අභිමත නම් කමාකරයි නැත්නම් දඬුවම් කරයි.
B - අල්ලාහ් නිදසුන් දැක්වීම හා සැසඳීමටත් ඔබ්බට ගිය කෙනෙකි.
C - අල්ලාහ්ගේ දාත්, සිෆාත් වෙන් වූ ඒවා ය.
D - ඉමාම්වරු වැරදි කිරීමෙන් ආරක්ෂා වී ඇත.
E - නිශ්චිත දිනයේ ලෝක අවසානය සිදුවේ. එවිට මිනිසුන් කබුර්වල සිට නැගිටුවනු ලැබේ.
ඉහත ප්‍රකාශවලින් අෂ්-අරියියාවරුන්ගේ මතයන් පමණක් පෙන්වන වරණය කුමක් ද?
(1) A C E (2) A B D (3) B C D (4) B D E (5) C D E

● පහත දැක්වෙනුයේ මුස්ලිම්වරු අතර ප්‍රචලිතව තිබෙන අරාබි වචන කිහිපයකි. ඒවා පදනම් කොටගෙන **23** සිට **25** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| A - තක්ලිද් | B - මුරීද් | C - ඉජ්මා |
| D - මුහාසබා | E - සහීහ් | F - හුකුම් |
| G - මතන් | H - මුජාහදා | I - ඉස්තිඃෆාර් |
| J - හල්කා | K - ෆර්ළ | L - ඉජ්තිහාද් |

**23.** ෆික්හු ක්ෂේත්‍ර හා සම්බන්ධ කාණ්ඩය තෝරන්න.
(1) A I (2) A L (3) C J (4) F I (5) J L

**24.** හදීස් ක්ෂේත්‍රය හා සම්බන්ධ කාණ්ඩය තෝරන්න.
(1) A B (2) C D (3) E G (4) F J (5) K F

**25.** කියාස් නීති ක්ෂේත්‍රයේ ප්‍රකාශ **දෙකක්** දැක්වෙන කාණ්ඩය තෝරන්න.
(1) A C (2) C D (3) E F (4) F K (5) J K

**26.** කිලාෆත්හි සාමයට බාධාවක් ඇති කරන ලද බවට කරුණු දක්වා කලීෆා උස්මාන් (රලි) තුමා විසින් රටින් පිටුවහල් කළ සහාබිවරයාගේ නම හා පිටුවහල් කළ ස්ථානය පිළිවෙළින්,
(1) සඃද් ඉබ්නු උබාදා (රලි) - නහර්වාන්
(2) අබූ දර් අල් කිෆාරි (රලි) - රබාතා
(3) ජව්ෆර් බින් අබි තාලිබ් - හබ්ෂා
(4) අම්මාර් බින් යාසිර් (රලි) - කූෆා
(5) මුආවියා බින් අබි සුෆියාන් (රලි) - ෂාම්

**27.** ඉස්ලාම් ශිෂ්ටාචාරය බිහිවීමට පදනම් වූ මූලික අංශ පමණක් නිරූපණය වන කාණ්ඩය වන්නේ,
(1) රිසාලත් - සීරා - ඉමාමත් ය.
(2) ඉබාදත් - කිලාෆත් - ඉමාරත් ය.
(3) තෞහීද් - රිසාලත් - මආද් ය.
(4) ඉස්මත් - තස්කියත් - විලායත් ය.
(5) තෞහීද් - සීරා - ඉමාරත් ය.

**28.** 'අහ්ලුත් තෞහීද් වල් අද්ල්' යන්නෙන් හඳුන්වන්නේ කවුද?
(1) ඒකදේව වාදීන් (2) මුඃතසිලාවරු (3) අදේවවාදීන්
(4) නබිතුමාගේ පවුලේ සාමාජිකයින් (5) මද්හබ් අනුගමනය කරන්නන්

**29.** පහත වගුව මගින් ඉස්ලාම් ෂරීආ හි විශේෂ ලක්ෂණ පෙන්වා දී ඇත.

| X | Y |
|---|---|
| (1) රබ්බානියියා | A - ජාත්‍යන්තරකරණය වූවකි |
| (2) ෂුමූලියියා | B - පොදු ලක්ෂණ සහිතයි |
| (3) වසතියියා | C - දේවත්වයෙන් යුක්තය |
| (4) ආලමියියා | D - මධ්‍යස්ථ බවින් යුක්තය |
| (5) උමූමියියා | E - පරිපූර්ණත්වයෙන් යුක්තය |

ඉහත X තීරුවේ ඇති අරාබි වචනවලට අනුරූපව Y තීරුවේ ඇති අර්ථ අනුපිළිවෙළින් ගැළපූ විට ලැබෙන වරණය වන්නේ,
(1) A B E D C (2) A C B E D (3) B A C D E
(4) C E D A B (5) C D A B E

**30.** පහත සඳහන් X තීරුවට අනුව Y තීරුවේ වචන නිවැරදිව සම්බන්ධ කිරීමේ දී පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

| X | Y |
|---|---|
| (1) අල්-හාවි | A - අලි බින් සීනා |
| (2) තාරික් තමත්දුන් | B - ඉබ්නු අබ්දිරබ්බිහි |
| (3) ඉක්දුල් ෆරීද් | C - ජූර්ජ් සෛදාන් |
| (4) අල්-කානූන් | D - අල්-මජ්සි |
| (5) කිතාබුල් මාලික් | E - සකරියියා අර්-රාසි |

(1) A B E D C (2) A C B E D (3) C B E A D
(4) E B A D C (5) E C B A D

**31.** 'ඉල්මුල් ජරහ් වත්තඃදීල්' යන්න පහත කුමන ක්ෂේත්‍රය හා සම්බන්ධ වන්නේ ද?
(1) ෆික්හ් (2) හදීස් (3) භූගෝල විද්‍යාව
(4) තසව්වුෆ් (5) තාරකා විද්‍යාව

**32.** ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල සහිරා විද්‍යාල ශාඛා බිහිකිරීමට මුල් වූ පුහුවරයා කවුද?
(1) ආචාර්ය T.B. ජායා (2) ආචාර්ය බදියුදීන් මහ්මූද්
(3) ආචාර්ය A.M.A. අසීස් (4) දොස්තර M.C.M. කලීල්
(5) සර් රාසික් ෆරීද්

Past Papers Wiki



**33.** හුදෛබියා සම්මුතියෙන් පසුව රෝම රජුට නබිතුමාගේ ලියුම රැගෙන ගිය සහාබි වන්නේ,
(1) අබ්දුල්ලා බින් ජහ්ෂ් (රලි) ය.
(2) සයිද් බින් සාබිත් (රලි) ය.
(3) හාරිස් බින් උමෛර් (රලි) ය.
(4) අබූ හුසෛමා අල් -අන්සාරි (රලි) ය.
(5) සෑද් බින් උබාදා (රලි) ය.

**34.** නුසෛරි ලෙස හඳුන්වන්නේ,
(1) ෂීආවරුන්ගෙන් එක් පාර්ශවයකි.
(2) මුඃතසිලාවරුන්ගේ එක් පාර්ශවයකි.
(3) කාරිජීවරුන්ගේ එක් පාර්ශවයකි.
(4) ස්පාඤ්ඤයේ ඇති කුඩා මුස්ලිම් රාජ්‍යයන්ගෙන් එකකි.
(5) ඉන්දියාවේ ඇති කුඩා මුස්ලිම් රාජ්‍යයන්ගෙන් එකකි.

**35.** පහත කාණ්ඩවලින්, අරාබි අක්ෂර වර්ග පමණක් සඳහන් වන වරණය තෝරන්න.
(1) අර්-රිකා, අල්-මුත්ආ, අල්-මුහක්කික්
(2) නස්තලික්, තව්කි, සීනත්
(3) කූෆි, නස්හු, සුලුසි
(4) අල්-මුහක්කික්, රයිහානි, මිස්මාර්
(5) රයිහානි, මිස්මාර්, හත් බාබුරි

**36.** පහත පාලකයන් අතුරෙන් තජ්දීද් සේවයේ පුරෝගාමීව සිටි පුද්ගලයා වන්නේ,
(1) ඉමාම් අබ්දුල්ලා බින් සුහ්රි (රහ්) වේ.
(2) කලීෆා උමර්බින් අබ්දුල් අසීස් (රහ්) වේ.
(3) මව්ලානා ෂාහ් වලියුල්ලාහ් (රහ්) වේ.
(4) ඉමාම් ෆුලෛල් බින් ඉයාල් (රහ්) වේ.
(5) ඉමාම් ගස්සාලි (රහ්) වේ.

**37.** ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක ලෙස කටයුතු කළ මුස්ලිම්වරු දෙදෙනෙකු වන්නේ,
(1) එස්.එච්. ඉස්මායිල් - බාකිර් මාකර් වේ.
(2) ආචාර්ය බද්උද්දීන් මහ්මුද් - දොස්තර එම්.සී.එම්. කලීල් වේ.
(3) ආචාර්ය ටී.බී. ජායා - එම්.එච්.එම්. අෂ්රෆ් වේ.
(4) එම්.එච්. මුහම්මඩ් - ඒ.සී.එස්. හමීද් වේ.
(5) එම්.එල්. අබූසාලි - එම්.එච්. නයිනා මරික්කාර් වේ.

**38.** අල්-කුර්ආනය, රිද්මයානුකූලව ලෙස පාරායනය කිරීම වෙනුවෙන් නබිතුමා විසින් ආශිංසනය කළ සහාබිගේ නම කුමක් ද?
(1) අබූ මූසා අල්-අෂ්අරි (රලි)
(2) අබූ දර් අල්-කිෆාරි (රලි)
(3) අබූ සඊද් අල්-කුද්රි (රලි)
(4) අබූ අයියූබ් අල්-අන්සාරි (රලි)
(5) අබූ උබෛදා අල්-ජර්රාහ් (රලි)

**39.** පහත සඳහන් අයගෙන් අල්-කුර්ආනය ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කළ විද්වතා
(1) මැල්කම් වේ.
(2) පික්තාල් වේ.
(3) කැට්ස්ටීවන් වේ.
(4) මාටින් ලින්ක්ස් වේ.
(5) මොරිස් බුකෙල් වේ.

**40.** මුජ්තහිද්වරුන් අතර මතභේද ඇතිවීම
(1) අනිවාර්ය වේ.
(2) වැරදි ය.
(3) මගහැරිය නොහැක්කකි.
(4) දඬුවම් ලැබිය හැකි ය.
(5) හැකියාවක් නොමැත.

**41.** කියාස් යන උප මූලාශ්‍ර පිළිබඳව වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) හදීස්හි පමණක් රැඳී තිබීම
(2) තාර්කිකත්වය පිළිගැනීම
(3) මුජ්තහිද් සියලු දෙනාගේ අනුමැතිය අපේක්ෂා කර සිටීම
(4) ඉමාම්වරුන්ගේ නිශ්ශබ්ද අනුමැතිය ප්‍රමාණවත් කොට සැලකීම
(5) ඉබාදත්, මුආමලාත් සියල්ලෙහි භාවිත කිරීමට හැකිවන පරිදි තිබීම

[හයවැනි පිටුව බලන්න.

**42.** පහත ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි ප්‍රකාශ තෝරන්න.

A - "අල්ලස් ගන්නන් හටත් අල්ලස් දෙන්නන් හටත් අල්ලාහ්ගේ ශාපය ඇත" යන්න ඉමාම්වරුන්ගේ ප්‍රකාශයකි.

B - "සම්පත් ඇතැම් අයගේ දෑත්වල නොරැඳිය යුතු ය. ඒවා ජනයා අතර සංසරණය වන්නක් ලෙස තිබිය යුතුය" යන්න ඉස්ලාම් මතය වේ.

C - මදීනා ශාසනය මගින් නබිතුමාගේ නායකත්වය පිළිගැනීමට හේතු වූ අතර මදීනාහි ජීවත් වූ සියලු ජනයාගේ අයිතීන් තහවුරු කරන ලදී.

D - 'ළමයින් මරන්නේ නැත' යන කොන්දේසිය හුදෛබියා සම්මුතියේ එකතුකොට තිබුණි.

(1) A B (2) A C (3) A D (4) B C (5) C D

**43.** යමෙකු තමාගේ ආහාර (රිස්ක්) විස්තීරණය කරගැනීමටත්, ආයුෂ දීර්ඝ කරගැනීමටත් කැමති වේ ද, එසේනම් ඔහු සම්බන්ධ වී ජීවත් විය යුතු යයි නබිතුමා සඳහන් කළ අය කවරෙක් ද?

(1) වයෝවෘද්ධයින් (2) අසල් වැසියන් (3) ලේ ඥාතීන්
(4) කුඩා ළමයින් (5) මුස්ලිම්වරු

**44.** පහත සඳහන් නීති මූලාශ්‍රයන් අතුරෙන් ඉස්තිහ්සාන් තීරණය ගැනීමට ආධාරවන නීති කාණ්ඩය තෝරන්න.

(1) කියාස්, උර්ෆු, මස්ලහා (2) කව්ලුස්සහාබා, උර්ෆු, ෂද්දුද් දරීආ
(3) කියාස්, මස්ලහා, කව්ලුස් සහාබා (4) උර්ෆු, ෂත්තුත් දරීආ, ශරථ, මන් කබ්ලනා
(5) මස්ලහා, ෂද්දුද් දරීආ, කව්ලුස් සහාබා

**45.** මෝගල් පාලකයා ඖරංගසීබ් තුමා සමයේ සම්පාදනය කළ ඉස්ලාම් නීති ග්‍රන්ථය වන්නේ,

(1) ෆතාවා ඉබ්නු තෛමියා ය. (2) තොලුකෛ අඩවු ය.
(3) ෆත්හුද් දයියාන් ය. (4) ෆතාවා මුආසරා ය.
(5) ෆතාවා ආලම් කීරි ය.

● අංක **46** සිට **50** දක්වා ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්න අංකයට අදාළ ව දී ඇති ප්‍රකාශ යුගලය සම්බන්ධයෙන් පහත සඳහන් (1), (2), (3), (4), (5) යන වරණවලින් වඩාත් ගැළපෙන යුගලය සහිත වරණය තෝරා එහි අංකය පිළිතුරු පත්‍රයේ සලකුණු කරන්න.

| අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| (1) | නිවැරදි ය. | නිවැරදි ය. |
| (2) | නිවැරදි ය. | වැරදි ය. |
| (3) | වැරදි ය. | වැරදි ය. |
| (4) | වැරදි ය. | නිවැරදි ය. |
| (5) | නිවැරදි ය. | නිවැරදි වන අතර පළමු ප්‍රකාශය තවදුරටත් විග්‍රහ කෙරේ. |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| **46.** | බානත් සුආද් යන ගීතය ගැයූ ගායක සුහෛල්, නබිතුමා ගේ ප්‍රශංසාවට පාත්‍ර වූවෙකි. | ඉජ්මා කිරීමට එකකට වඩා වැඩි වූ මුජ්තහිද් තිබිය යුතුය යන්න එක් නිර්ණායකයකි. |
| **47.** | ඉමාම් ජඃෆර් බින් සාදික්ගේ පුත්‍රයා වූ ඉමාම් ඉස්මායිල් නමැත්තාව අනුගමනය කරන්නන් ඉස්මාඉලියියාවරු වේ. | අල් හම්රා මාලිගාව, අහ්මර් විසින් ස්පාඤ්ඤයේ නිර්මාණ කරන ලදී. |
| **48.** | ඉඳගැනීමට ඉඩ දෙන පුටුව මෙන් ප්‍රතිවිරුද්ධ අදහස් ද පවති යන්න මුස්තෆා අහමද් සර්ක්කා සඳහන් කර ඇත. | කලීෆා මුආවියා (රලි) තුමා හදීස් එක්රැස් කිරීමේ කාර්යයට ඉමාම් සුහ්රි (රහ්) තුමාව යොදවා තිබුණේ ය. |
| **49.** | හොඳ කියා දී වැරදි වැළැක්වීමේ දී පිරිමි හා ස්ත්‍රීන් සමාන වගකීම් ඇති අය වේ යන්න ඉස්ලාමීය මතය වේ. | තජ්දීද් කටයුතු සාමූහිකව හා තනිවම ද සිදුවිය හැකි ය. |
| **50.** | අලි (රලි) තුමා නජ්රාත් ප්‍රදේශයේ කිතුනුවන් හා ඇතිකර ගත් ගිවිසුම නජ්රාන් ගිවිසුම ලෙස හැඳින්වේ. | අයිෂා (රලි) හෆ්සා (රලි) දෙදෙනා පිළිවෙළින් කලීෆාවරුන් වන අබූ බක්කර් (රලි) උමර් (රලි) යන අයගේ දූවරුන් වේ. |

PAST PAPERS WIKI

* * *

Past Papers Wiki





සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

ඉස්ලාම් ශිෂ්ටාචාරය II
இஸ்லாமிய நாகரிகம் II
Islamic Civilization II

47 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

✻ I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** (i) හදීස් නිර්දේශිත නීති මූලාශ්‍රයක්ය යන්න තහවුරු කෙරෙන අල්-කුර්ආනයේ දැක්වෙන සාධක **දෙකක්** සඳහන් කරන්න.

(ii) හදීසයක් ප්‍රතික්ෂේප කිරීම පදනම් වන කරුණු **දෙකක්** සඳහන් කරන්න.

(iii) ගොතන ලද හදීස් බිහිවීමට හේතු **හතරක්** සඳහන් කරන්න.

(iv) මුතවාතිර්, ආහාද් යන හදීස් වර්ග ගැන කෙටියෙන් විස්තර කරන්න.

(v) හදීස් ක්ෂේත්‍රයේ වර්ධනයට ඉමාම් බුහාරි (රහ්) තුමා ලබාදුන් දායකත්වය විස්තර කරන්න.

(ලකුණු 04 × 5 = 20 යි)

**2.** (i) කිලාෆතුර්රාෂිදාහි පළමු කලීෆාවරුන් දෙදෙනා තෝරන ලද ක්‍රම සඳහන් කරන්න.

(ii) කලීෆා අබූ බක්කර් (රළි) තුමා කිලාෆතය භාර ගැනීමෙන් පසුව කළ දේශනය කෙටියෙන් සඳහන් කරන්න.

(iii) කලීෆා උමර් (රළි) තුමාගේ පාලන සමයේ රාජධානිය ව්‍යාප්ත වූ ආකාරය ගැන පැහැදිලි කරන්න.

(iv) උමයියා කලීෆාවරු රටේ පරිපාලනයේ ඇති කළ වෙනස්කම් **හතරක්** විස්තර කරන්න.

(v) කලීෆා අබ්දුල් මලික්, උමයියා කිලාෆතය ස්ථිර කිරීමට ලබා දුන් දායකත්වය අගය කරන්න.

(ලකුණු 04 × 5 = 20 යි)

**3.** (i) මුස්ලිම්වරුන් සංගීත ක්ෂේත්‍රයට හඳුන්වාදුන් සංගීත භාණ්ඩ **හතරක්** සඳහන් කරන්න.

(ii) ඉස්ලාම් හි සංගීතය අනුමත කර තිබේ ද යන්න විස්තර කරන්න.

(iii) උමයියා අබ්බාසි සමයන්හි නිර්මාණය කරන ලද බලකොටු **දෙකක්** පිළිබඳව විස්තර කරන්න.

(iv) අක්ෂර කලාව කෙරෙහි මුස්ලිම්වරුන් උනන්දුව දැක්වීමට හේතු වූ කරුණු **දෙකක්** පැහැදිලි කරන්න.

(v) අරාබි අක්ෂර කලාවෙහි අර්-රික්ආ හා අන්-නස්හු ගැන කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 04 × 5 = 20 යි)

## II කොටස

**4.** (i) වෛද්‍ය ක්ෂේත්‍රයේ වර්ධනයට මුස්ලිම් විද්වතුන් දෙදෙනෙක් සිදු කළ දායකත්වය විස්තර කරන්න.

(ii) කලීෆා මඃමූන් සමයේ තාරකා විද්‍යා ක්ෂේත්‍රයේ ඇති වූ වර්ධනය පැහැදිලි කරන්න.

(ලකුණු 10 × 2 = 20 යි)

**5.** (i) ඉස්ලාම් කිලාෆතයේ ගෝත්‍රික විසංවාද ඇති කළ බලපෑම් විමසන්න.

(ii) කුරුස යුද්ධ, ඉස්ලාම් ලෝකයේ ඇති කළ බලපෑම් විස්තර කරන්න.

(ලකුණු 10 × 2 = 20 යි)

[දෙවැනි පිටුව බලන්න.

**6.** (i) මුඃතසිලා සහ අෂ්-අරියියා චින්තන අතර දක්නට ඇති වෙනස්කම් සංසන්දනය කරන්න.

(ii) ෂිආවරුන්ගේ උප කොටස් වූ නුසෙයිරිවරුන් හා බාතිනීවරුන් පිළිබඳව පැහැදිලි කරන්න.

(ලකුණු $10 \times 2 = 20$ යි)

**7.** (i) ශ්‍රී ලංකාවට ඉස්ලාමය හඳුන්වා දුන් ආකාරය මූලාශ්‍ර සහිතව විස්තර කරන්න.

(ii) ශ්‍රී ලංකාව ජාත්‍යන්තරය හා සම්බන්ධ කිරීමට මුස්ලිම්වරුන් දුන් දායකත්වය විස්තර කරන්න.


(ලකුණු $10 \times 2 = 20$ යි)


**8.** (i) දේව නීතිය හා මිනිසාගේ නීතිය අතර වෙනස්කම් විස්තර කරන්න.

(ii) පවුල් නිර්මාණයේ දී පුරුෂ හා ස්ත්‍රිය යන දෙදෙනාගේ අයිතිවාසිකම් හා යුතුකම් ගැන පැහැදිලි කරන්න.

(ලකුණු $10 \times 2 = 20$ යි)

* * *


වාරෙටම ඕන කරන පොත්
ඕඩර් කරලා දැන් ගෙදරටම ගෙන්
Store
25% OFF
ALL BOOKS
Including Exercise Books,
CR Books, and B5 Books
ම අභ්‍යාස පොතකට 25%ක විශේෂ වට්
ORDER BOOKS FROM LOL BOOKS STORE


ORDER GCE A/L
SHORT NOTES, MODEL,
REVISION BOOKS & PAST
PAPERS IN SINHALA, ENGLISH
& TAMIL MEDIUM
LOL
BOOK
STORE
CASH ON DELIVERY
AND KOKO PAYMENT
AVAILABLE
WHATSAPP - 0717774440
WEBSITE: WWW.LOL.LK
GET READY FOR YOUR A/Ls